**දේපල වෙළදාමේ රන් සන්නාමය - John Keells Properties.**

වසර එකසිය පනහක් තරම් දිගු ඉතිහාසයකට උරුම කම් කියන, තවමත් ව්‍යාපාර ලෝකයේ දැවැන්තයන් ලෙස වැජඹෙන සමාගම් ශ්‍රී ලංකාවේ ඇත්තේ අතළොස්සක්. ඒ අතරින් සුවිශේෂ ස්ථානයක් ගන්නා සමාගමක් වන්නේ John Keells සමාගමයි. මෙ මව් සමාගම සමගම අනුබද්ධ වී තිබෙන John Keells Properties ආයතනය දේපළ වෙළදාම් අංශයේ පුරෝගාමියෙක් ලෙස හදුන්වන්නට හැකියි. ලංකාවේ පළමු වතාවට ඉදි කළ ප්‍රධාන පෙළේ නිවාස ව්‍යාපෘති රැසකම ඉදිරි පෙළ කොටස් කරුවෙක් ලෙස සැලකෙන මේ ආයතනයට, නිවාස ව්‍යාපෘති හා දේපල වෙළදාම ගැන ඇත්තේ ඉතා ඉහළ මට්ටමේ අත්දැකීම් ගොන්නක් මෙන්ම කීර්තිනාමයක්.

දේපළ වෙළදාම් හා ආයෝජනය යන මේ ක්ෂේත්‍ර වල John Keells Properties මෑත කාලයේ අත් කර ගෙන ඇති ජයග්‍රාහණ මොනවාද යන්න ගැන පැහැදිලි වැටහීමක් එම ආයතනයේ දේපල සංවර්ධන හා කළමණාකරණ අංශ ප්‍රධානී නයන මාවිල්මඩ මහතා ගේ සාකච්ඡාව තුළින් ලබා ගත හැකියි.




John Keells Properties හි වෙළද කළමණාකාර ආසිරි පෙරමුණගම මහතා සමග YouTube ඔස්සේ කළ පිළිසදරකදී ඔහු පවසන්නේ දැනට ලංකාවේ ප්‍රධානම ගොඩනැගිලි ව්‍යාපෘති ගණනාවක් මේ ආයතනයෙන් ක්‍රියාත්මක කරන බවයි. Emperor, Monarch, Victoria Golf Course හා ජා ඇළ පිහිටා ඇති K-zone ද මේ අතර ඇති බව ඔහු හෙළි කරනවා. ඊට අමතරව මෑත කාලයේදි කොළඹ නගරයේ ඉදිවුණු විශාලම තනි පුද්ගල නිවාස ව්‍යාපෘතියක් වන Cinnamon Life වෙතත් ආයෝජනය කර ඇත්තේ John Keells Properties ආයතනයයි. මහා පරිමාණ, මෙන්ම ඉහළ පෙළේ ව්‍යාපෘති ගණනාවකට සම්බන්ධ මෙවැනි ආයතනයක් හරහා දේපලක් මිළදී ගැනීමෙන් එහි ඇති ගුණාත්මක බව හා විශ්වාසවන්ත බව ගැන තෘප්තිමත් හැගීමක් ඇති කර ගන්නට ඕනෑම අයෙකුට එහි පහසු වෙනවා.

මීට අමතරව John Keells වෙතින් නිමවන නිවාස ව්‍යාපෘති වල සුවිශේෂ ලක්ෂණයක් විදියට නව තාක්ෂණය මුසු වූ අළුත්ම අත්දැකීමක් ලබා දීමට කටයුතු සූදානම් කර තිබීම පෙන්වා දෙන්නට හැකියි. නයන මාවිල්මඩ මහතා මේ පිළිබදවත් අවධානය යොමු කරමින් මීට උදාහරණයක් ලෙස TRI-ZEN නිවාස ව්‍යාපෘතිය සතු SMART HOME පද්ධතිය පිළිබදව විස්තර කරනවා. ඔහුට අනුව නිවසේ බොහෝ උපාංග SMART තාක්ෂනය ඔස්සේ තමන්ගේ කටහඩ මගින් පාලනය කරන්නට හැකියි. ශ්‍රී ලංකාවට මෙය තරමක අළුත් අත්දැකීමක් වුණත්, John Keells Properties වෙතින් ඉදි වන TRI-ZEN නිවාස සංකීර්ණයේ දි ඔබට එය අත් විදින්නට අවස්ථාව ලැබෙනවා. ඒ වගේම ආයතනය මගින් සිදු කරන "සමාජ පරිවර්තනයක්" ගැනත් මාවිල්මඩ මහතා සදහන් කරනවා. එයින් අදහස් වෙන්නේ නිවාස සංකිර්ණය තුළම පිහිනුම් තටාක, ක්‍රිඩා පිටි, සුපිරි වෙළදසැල් ආදී පහසුකම් ඉදි කොට වඩා ඵලදායි ජීවන රටාවකට ජනතාව හුරු කිරීමයි. John Keells Properties වැනි අළුත් දේ අත් හදා බලන නිර්මාණශීලි ආයතනයකින් තම නිවාස සිහිනය සැබෑ කරගන්නා අයෙකුට මේ සියලු අත්දැකීම් සිත පුරා විදීමට හැකියි.

කොළඹ අවටින් නිවසක් මිළට ගැනීම බොහෝ දෙනාට සිහිනයක් පමණක් වී ඇත්තේ ඒවායේ ඇති අධික මිළ ගණන් නිසාවෙන්. එසේ වුවත් John Keells Properties සමග එක්වෙන ඔබට සහනදායී මිළකට කොළඹ අවටින් ඉතා හොද නිවසක් මිළට ගන්නට හැකියාව ලැබෙනවා. විශේෂයෙන් ම Tri-Zen නිවාස ව්‍යාපෘතිය පිළිබදව සැලකුවහොත් එය පිහිටා ඇත්තේ කොළඹ 2 හි වේබෑක් පෙදෙසට මායිම් වයි. කොළඹ නගරයේ ව්‍යාපාරික හදවත ලෙස හදුනාගන්නා මේ පෙදෙසින් නිවසක් ලබා ගැනීම ඉතාමත් හොද ආයෝජනයක් මෙන්ම අවස්ථාවක්. නයන මාවිල්බඩ මහතා මේ පිළිබදව පැවසුවේ " කාලයත් සමගම මේ ප්රදේශයේ මෙවැනි නිවාස ව්‍යාපෘති ඉදි කිරීම සිමා වීමට ඉඩ ඇති " බවයි. එම නිසා John Keells Properties වෙතින් මේ පිරිනමන්නේ අනගි අවස්ථාවක් බව සලකන්නට හැකියි. තවද තම පාරිභෝගිකයන් ගේ පහසුව පිළිබද නිතරම සැලකිලිමත් වෙන ආයතනයක් වන John Keells Properties, ඔවුන්ට පහසු ගෙවීමේ විවධ ක්‍රම හදුන්වා දී තිබෙනවා. මාවිල්මඩ මහතා තම සාකච්ඡාවේදී සදහන් කරන Free Mortgage ක්රමය ඉන් එකක්. මෙහිදී ජනතාවට නිවාස මිලදී ගැනීමේදී මුලික ගෙවීමෙන් අනතුරුව වසරක පොලි රහිත සහන කාලයක් ලබා දීමට ඔවුන් සූදානම්. මෙවැනි නැවුම් සංකල්ප හරහා පිළිබිඹු වන්නේ තාක්ෂණික මෙන්ම මුල්‍ය ක්ෂේත්‍රයේ John Keells Properties ආයතනයට ඇති ශක්තියයි.

දේපල මිළට ගැනීමේදී John Keells Properties හා එක්විය යුත්තේ ඇයි යන්න පිළිබද තවත් තොරතුරු දැනගැනීමට John Keells Properties හි දේපළ සංවර්ධන හා කළමණාකරණ අංශ ප්රධානී නයන මාවිල්මඩ මහතා සහ එම ආයතනයේ ම වෙළද කළමණාකාර ආසිරි පෙරමුණගම මහතා John Keells Properties YouTube නාලිකාව ඔස්සේ සිදුකරන සාකච්ඡාව නරඹන්න.